කාන්තාවන් පිළිබඳව වන පුවත් වාර්තාවන් තුළ, කාන්තාවන්ගේ බාහිර ස්වරූපය පුවතට සෘජුව අදාළ නොවන අවස්ථාවන්හිදී පවා "රූමත්", "සුරූපී" වැනි යෙදුම් භාවිතා කරමින් එම බාහිර ස්වරූපය ඉස්මතු කොට දැක්වීම ඇතැම් මාධ්‍ය මගින් සිදුකරනු දක්නට ලැබේ.

කෙසේ නමුත් ගැටළුව වන්නේ පුවතකට සෘජුව අදාළ නොවන අවස්ථාවක කාන්තාවන්ගේ බාහිර ස්වරූපය ඉස්මතු කිරීම ඔස්සේ කාන්තාව ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ බාහිර ස්වරූපය ඔස්සේ නිර්වචනයට ලක් වීම නොවේද? එසේම පුරුෂ පක්ෂය සම්බන්ධයෙන් ඔවුන්ගේ බාහිර ස්වරූපය මාධ්‍ය තුළ ඉස්මතු කෙරෙනු දක්නට ලැබීම දුලබ වේ. එසේ නම් මෙය ස්ත්‍රී පුරුෂ භේදය සලකමින් කාන්තාවට වෙනස් ලෙසකින් සැලකීමක් නොවේද? පුවත් වාර්තාවන් තුළ පුවතට සෘජුව අදාළ නොවන විටකදී කාන්තාවගේ බාහිර ස්වරූපය ඉස්මතු කෙරෙන්නේ පුවතට පාඨක ආකර්ෂණයක් ලබාගැනීමට යැයි ඔබ නොසිතන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Lankadeepa**
See Less